දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය - 2021

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

-----------------------------------------------------------------

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-------------------------------------------------------------

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------------------------------------- | ---------------------------- | ----------- |
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 හි සඳහන් නියමයන්ට අනුකූලව පිළියෙල කර නොතිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය රු.377,590 කින් වැඩියෙන්ද, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය රු.102,475 කින් අඩුවෙන්ද හා 2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ වල අගය රු.275,115 ක් අඩුවෙන්ද දැක්වුණි. | ඉදිරි වර්ෂයේ සිට ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 හි සඳහන් නියමයන්ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 49 ඡේදය ප්‍රකාරව, වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට අදාළ වත්කම් පන්තිය එකවර ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, ඊට පටහැනිව අධිකාරිය සතු පරිගණක හා උපකරණ අතරින් 2017 වර්ෂයට පෙර මිලදී ගෙන තිබුණු ශුද්ධ අගය රු.257,180 ක් වූ පරිගණක හා උපකරණ පමණක් 2022 පෙබරවාරි 28 දින රු.743,750 කට ප්‍රත්‍යාගණනය කර රු.486,570 ක ප්‍රත්‍යාගණන ලාභයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම එම ප්‍රත්‍යාගණන අගය මත පදනම්ව රු.148,750 ක ක්ෂය ගණනය කර | ඉදිරියේදී වත්කම් ප්‍රත්‍යාගණනය කරන අවස්ථාවලදී ප්‍රමිතියේ සඳහන් අවශ්‍යතාවයන් ප්‍රකාරව කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි විධිවිධාන ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතුය. |

ගිණුම්ගත කර තිබුණි. තවද මෙම ප්‍රත්‍යාගණනයට අදාළ විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී භාවිතයෙන් ඉවත් කර තිබුණු ධාරණ අගය රු.102,475 ක් වූ විවිධ වත්කම් වර්ග 10 ක් විකිණීමෙන් ඇතිවී තිබුණු රු.84,175 ක අලාභය සමාලෝචිත වර්ෂයේ ආදායමට ලියාහරිනු වෙනුවට පරිගණක හා උපකරණ ප්‍රත්‍යාගණනයෙන් ජනනය වී තිබුණු ලාභයට එරෙහිව ගලපා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය ඊට සමාන අගයකින් අඩුවෙන් දැක්වුණි. | 2021 වර්ෂයේදී භාවිතයෙන් ඉවත් කෙරුණු වත්කම් විකිණීමෙන් ජනනයවී තිබුණු රු.84,175 ක අලාභය ප්‍රාග්ධන ලාභ/අලාභ (Capital Gain/loss) ලෙස හඳුනා ගෙන තිබුණු බව, එම වර්ෂය අවසානයේදී වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් හඳුනාගත් ප්‍රාග්ධන ලාභය වූ රු.486,569 ක් ප්‍රාග්ධන ලාභ/අලාභ ගිණුමට බැර කර තිබුණු බව හා ප්‍රාග්ධන ලාභ/අලාභ ගිණුමෙහි ශුද්ධ ප්‍රතිඵලය ලෙස රු.402,393 ක් හඳුනා ගෙන ඇති බව. | වත්කම් විකිණීමෙන් ජනනය වන අලාභය වර්ෂයේ ආදායමට ලියාහැරිය යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1978 අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009(2) දරන කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 02 ඡේදය | 2021 දෙසැම්බර් 31 දිනට රු.32,489,006 ක් වූ දේපල පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය හා ප්‍රත්‍යාගණන අගයන් ඇතුළත් කළ හැකි වන පරිදි විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණු අතර ඒ වෙනුවට වත්කම් අයිතම ප්‍රමාණය දැක්වෙන පරිදි ප්‍රධාන ඉන්වෙන්ට්‍රි ලේඛනය පමණක් පවත්වා තිබුණි. | දේපල පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය සහ ප්‍රත්‍යාගණන අගයන් ඇතුළත් වන පරිදි ලේඛනයක් පිළියෙල කර පවත්වාගෙන යාමට ඉදිරියේදී කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ආ) 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියලුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මඟින් රාජ්‍ය නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කළ යුතු වුවද, අධිකාරිය සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන තිබුණු නීති නිලධාරීගේ පැමිණීම හා පිටවීම | නීති නිලධාරී විසින් පිළියෙල කර තිබුණු මාසික රාජකාරි වාර්තාවට අනුව සැහීමකට පත්වීමෙන් අනතුරුව ඔහුගේ මාසික වැටුප් ගෙවූ බව, අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අවධානය | ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මඟින් නීති නිලධාරීගේ කාර්යාලයට පැමිණීම හා |

| | | | | |
|---|---|---|---|---|
| | | අධිකාරියේ ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍රය තුළ සටහන් කර නොතිබුණි. පැමිණීම හා පිටවීම කිසිදු ආකාරයකින් සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී එම නිලධාරියා වෙත දළ වැටුප් හා දීමනා ලෙස රු.841,455 ක් වැයකර තිබුණි. | මේ වෙත යොමුව ඇති බව, ඔවුන්ගේ තීරණ ප්‍රකාරව ඉදිරියේදී නීති නිලධාරී තනතුරෙහි පැමිණීම හා පිටවීම සනාථ කරගැනීමට අදාළ කටයුතු අධිකාරියේ කළමනාකාරිත්වය විසින් ඉටු කරන බව. | පිටවීම සනාථ කළ යුතුය. |
| (ඇ) | 2019 අප්‍රේල් 22 දිනැති අංක 09/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 2019 ජූලි 01 දින සිට ක්‍රියාත්මක කර තිබුණු 2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය නිලධරයන් සඳහා මාසිකව ගෙවීමට අනුමත කර තිබුණු රු.2,500 ක අන්තර් දීමනාව අර්ධ රාජ්‍ය සේවකයින්ට ගෙවිය නොහැකි නමුත්, 2019 ජූලි මාසයේ සිට 2021 දෙසැම්බර් මාසය දක්වා වූ මාස 30 ක කාලය තුළදී අධිකාරියේ නිලධාරීන් 13 දෙනෙකු වෙත රු.690,648 ක් අන්තර් දීමනා ලෙස ගෙවා තිබුණි. | 2019 ජූලි 01 දින සිට ක්‍රියාත්මක අංක 09/2019 දරන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 'සියලුම' රාජ්‍ය නිලධරයින් වෙත මෙම දීමනාව ලබා ගත හැකි බව සඳහන්වී ඇති බැවින් ඒ මත පදනම්ව 2019 ජූලි මාසයේ සිට මෙම දීමනාව ගෙවූ බව, 2022 මාර්තු 29 වන දින රැස්වූ අධ්‍යක්ෂක මණ්ඩලය මෙම දීමනාව සම්බන්ධව සාකච්ඡා කළ බව හා මෙම දීමනාව සම්බන්ධයෙන් සෞඛ්‍ය ලේකම් මගින් ආවරණ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | අන්තර් දීමනා ලෙස ගෙවා තිබුණු රු.690,648 ක් අදාළ දීමනා ලාභීන්ගෙන් හෝ වගකිවයුතු පාර්ශවයන්ගෙන් ආපසු අයකර ගත යුතුය. |
| (ඈ) | 2021 ජුනි 15 දිනැති අංක 21/Misc (032) දරන අමාත්‍ය මණ්ඩල තීරණයට සහ සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2021 ජුනි 16 දිනැති අංක MIN/add/See/Admin/16/21 දරන ලිපිය | 2021 ජුනි මාසයේ සිට 2021 අගෝස්තු මාසය දක්වා වූ මාස 03 ක කාලපරිච්ඡේදය වෙනුවෙන් සෞඛ්‍ය සේවයේ නියුතු කාර්යය මණ්ඩලය සඳහා මාසිකව ගෙවීමට අනුමත කර තිබුණු රු.7,500 ක විශේෂ මාසික දීමනාව අධිකාරියේ කාර්යය මණ්ඩලය වෙත ගෙවිය නොහැකි වුවද, එම මාස 03 ක කාලය තුළදී අධිකාරියේ කාර්ය මණ්ඩලයේ 12 දෙනෙකු වෙත රු.262,375 ක් විශේෂ දීමනා ලෙස ගෙවා තිබුණි. | අධිකාරිය රෛඛීය අමාත්‍යාංශය යටතේ වූ ආයතනයක් බැවින් මේ සම්බන්ධව සෞඛ්‍ය ලේකම් විසින් නිකුත් කර තිබුණු ලිපිය අනුව සියලුම කාර්ය මණ්ඩලය වෙත මෙම දීමනාව ගෙවිය හැකි බව, අධිකාරියේ සභාපති විසින් දුරකතනයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරියකු සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව මෙම දීමනාව අධිකාරියෙහි නිලධාරීන් වෙත ගෙවිය හැකි බව සභාපති විසින් ලිඛිතව දන්වා එවා ඇති බව, ඒ | විශේෂ දීමනා ලෙස ගෙවා තිබුණු රු.262,375 අදාළ දීමනා ලාභීන්ගෙන් හෝ වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කර ගත යුතුය. |

අනුව අධිකාරියෙහි සියලුම ස්ථිර කාර්ය මණ්ඩලය වෙත 2021 ජූනි මස සිට 2021 අගෝස්තු මස දක්වා ගෙවීම් කළ බව හා 2021 වර්ෂය තුළදී විටින් විට රජය විසින් පනවන ලද, නිරෝධාන ඇඳිරි නීතිය, පළාත් අතර සංචරණ සීමා, රට වසා තැබූ ආදී සියලුම අවස්ථාවලදී අධිකාරියෙහි කාර්ය මණ්ඩලය අඛණ්ඩව සේවයට වාර්තා කළ බව.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,523,419 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,337,220ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.186,199 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පුද්ගල පඩිනඩි සහ වැඩ සටහන් සඳහා වූ වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 62 කින් හා සියයට 65 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ දේශීයව සහ විදේශීයව ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.5,960,583 කින් එනම් සියයට 264 කින් වැඩිවී තිබුණු අතර අධිකාරියේ පුද්ගල පඩිනඩි හා වැඩ සටහන් සඳහා වූ වියදම පිළිවෙලින් රු.5,171,969 කින් සහ රු.2,806,599 කින් එනම් සියයට 62 කින් සහ සියයට 65 කින් වැඩිවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය විසින් 1948 මනෝ උපදේශන සේවාව වැඩිදියුණු කිරීම වෙනුවෙන් රු.1,380,500 ක්ද, එම සේවාව ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් රු.2,022,500 ක්ද හා එම සේවාව පවත්වාගෙන යාම වෙනුවෙන් රු.1,205,085 ක් ද වශයෙන් මුළු එකතුව රු.4,608,085 ක් වැයකර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු ඇමතුම් 9,025 කින් ඇමතුම් 2,797 ක් වෙනුවෙන් උපදේශන සේවා | කොන්ත්‍රාත් පදනම මත සේවය කරන මනෝ උපදේශන නිලධාරීන් දෙදෙනෙකු සේවාව ලබා දුන් නමුත් 2021 වර්ෂය තුළදී උපදේශන සේවාව ප්‍රවර්ධනය කිරීමෙන් අනතුරුව ලැබෙන ඇමතුම් ප්‍රමාණය අධික වූ බැවින් අධිකාරිය විසින් සහතික පත්‍ර මනෝ උපදේශන පාඨමාලාවක් සිදු කර පුහුණුව ලබාදී මනෝ උපදේශන නිලධාරීන් 23 දෙනෙකු පුහුණු කළ | සේවාවේ ඵලදායිතාවය මැනීමට කටයුතු කරමින් සේවාව පුළුල් කිරීමට උත්සාහ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සපයා තිබුණු අතර ඇමතුම් 1,084 ක් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය හා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වැනි අදාළ ආයතන වෙත යොමු කර තිබුණි. ඇමතුම් 2,797 ක් වෙනුවෙන් උපදේශන සේවා සපයා තිබුණු නමුත් ඒ පිළිබඳ පසුවිපරමක් සිදු කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණු බැවින් එම සේවාවේ ඵලදායිතාවය මැනීමට අධිකාරියට නොහැකිවී තිබුණි. | බව, එම පුහුණුව ලත් නිලධාරීන් ස්වේච්ඡාවෙන් පස්වරු 4.00 න් පසුව දුරකථන ඇමතුම් සඳහා උපදේශන සේවාව ලබාදීම සිදු කරන බව, මනෝ උපදේශනය ලබන උපදේශනලාභීන්ගෙන් යම් ප්‍රමාණයක් පමණක් නැවත ඇමතුම් ලබා ගන්නා බව හා සීමිත මානව හා භෞතික සම්පත් වලට අනුව පසු විපරම් කිරීම අසීරු කටයුත්තක් බව. | |
| (ආ) | 1948 උපදේශන සේවාව සඳහා දෛනිකව ලැබෙන ඇමතුම් හා ඒවා සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු ඇතුළත්වන පරිදි සහ එම තොරතුරු ඉහල නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක්වන බවට සනාථ කෙරෙන පරිදි විධිමත් ලේඛනයක් පවත්වා නොතිබුණු බැවින් 1948 උපදේශන සේවාවට ලද ඇමතුම් සහ සිදුකර තිබුණු උපදේශන සේවා සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබුණු සංඛ්‍යාත්මක තොරතුරුවල නිවැරදිතාවය සනාථ කර ගත නොහැකි විය. | 1948 මනෝ උපදේශන සේවාව සඳහා දෛනිකව ලැබෙන ඇමතුම් පිළිබඳව දත්ත හා තොරතුරු එක් රැස් කොට මාසිකව ලැබුණු ඇමතුම් සංඛ්‍යාව පිළිබඳව ප්‍රගති වාර්තා පිළියෙල කරන බව, එම ප්‍රගති වාර්තා සභාපති වන මා විසින් සහතික කරන බව හා උපදේශනය ලබා ගත් පුද්ගලයින් පිළිබඳ තොරතුරු උපදේශන නිලධාරීන් විසින් සටහන් තබා ගන්නා බව. | 1948 උපදේශන සේවාවේ දෛනික තොරතුරු විධිමත් පරිදි සටහන් කෙරෙන සහ අධීක්ෂණය සිදු කළ හැකි වන පරිදි ලේඛනයක් හඳුන්වාදී පවත්වා ගත යුතුය. එය අවශ්‍ය විටදී විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

## 3.2 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ ඇති කරගෙන තිබුණු එකඟතාවයකට අනුව ගෝලීය වැඩිහිටි දුම්කොල සමීක්ෂණයේ අවසන් වාර්තාව 2021 ඔක්තෝබර් 31 දිනට පෙර නිකුත් කළ යුතු වුවද, 2022 මැයි 24 දින වන විටත් එම සමීක්ෂණයේ අවසන් වාර්තාව නිකුත් කර නොතිබුණි. | ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුමේ කාලය 2021 ඔක්තෝබර් 31 දින දක්වා දීර්ඝ කළ බව හා 2022 මැයි 23 දින ලෝක වැඩිහිටි දුම්කොළ සමීක්ෂණය 2019/2020 හි කරුණු පත්‍රිකාව (Fact sheet) මාධ්‍ය වෙත නිදහස් කළ බව. | ගෝලීය වැඩිහිටි දුම්කොල සමීක්ෂණයේ අවසන් වාර්තාව කඩිනමින් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළදී ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ලබාදීමට එකඟවී තිබුණු රු.2,979,900 ක මූල්‍ය ප්‍රදාන උපයෝගී කරගෙන දුම්කොළ වගාවෙන් තොර තිරසාර දිස්ත්‍රික්ක නිර්මාණය කිරීමේ නියමු ව්‍යාපෘතිය (Creating Sustainable tobacco Cultivation free districts through a pilot test) යටතේ අනුරාධපුර හා මොණරාගල යන දිස්ත්‍රික්ක 02 හි දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් පවත්වා තිබුණි. නමුත් එම වැඩසටහන් සඳහා අවශ්‍ය ආහාර හා නවාතැන් පහසුකම් සපයා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව කටයුතු කරමින්, විද්‍යුත් තැපැල හරහා කැඳවා තිබුණු මිල ගණන් මත පදනම්ව හා ප්‍රසම්පාදන කමිටුවක් මඟින් සැපයුම්කරුවන් තෝරා ගැනීම වෙනුවට අධිකාරියේ සභාපතිවරයා විසින් තෝරා ගෙන තිබුණු සැපයුම්කරුවන්ගෙන් ආහාර හා නවාතැන් පහසුකම් සපයා ගැනීම වෙනුවෙන් රු.1,350,104 ක් ගෙවා තිබුණි. ඒ හේතුවෙන් ප්‍රසම්පාදනයේ විනිවිදභාවය ආරක්ෂාවී නොතිබුණි. | මෙම නියමු ව්‍යාපෘතිය කොරොනා වසංගතය පැතිර ගිය කාලය තුළ ක්‍රියාත්මක කළ බව, තැපැල් දෙපාර්තුමේන්තුව ඔස්සේ ලිපි හුවමාරුව නිසි ලෙස සිදු නොවූ බැවින් හා 2021 ජනවාරි 21 සිට 2021 මාර්තු 31 දින දක්වා පැවැත්වීමට නියමිතව තිබුණු නමුත් මුදල් ලැබීමේ ප්‍රමාදය නිසා කඩිනමින් වැඩසටහන පැවැත්වීමට සිදුවූ බැවින් විද්‍යුත් තැපැල මඟින් මිල ගණන් කැඳවූ බව, වැඩසටහන සඳහා යොදාගත් දිනයට ආදාළව ශාලා පහසුකම් ලබාගත හැකි හෝටලය තුළ වැඩසටහන පැවැත්වූ බව, වැඩසටහන සඳහා ඉහල රාජ්‍ය නිලධාරීන් සහභාගී වූ අතර එම නිලධාරීන්ට පහසු දිනයක් යොදා ගත් බව හා තෝරාගත් හෝටලය සෞඛ්‍ය අමාත්‍යාංශයේ කොරෝනා වසංගත පාලනය සඳහා වන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කිරීමට එකඟවූ බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතුය. |